## 148 – මලක සුවඳ

මලක සුවඳ මසිත තුළට දෙන්න සමිඳුනේ
මලක මෙලෙක මහද තුළට දෙන්න දෙව්ඳුනේ
එවිට මලක මෙලෙක සමග සුවඳ සුදු බැවේ
ඔබට පුදමි මහද සමග ම'සිත පඬුරු සේ

දෙව් පියාණනේ දෙව් පියාණනේ
අපගෙ පඬුරු බාර ගන්න, දෙව් පියාණනේ

පුපය මිදියුෂ සමගින ඔබට පිදෙන සේ
මගෙ ගතසිත සමිඳුනි ඔබ නමට පුදන්නේ
පිදෙන පඬුරු දෙව්පුතු සිරුරට හැරෙන ලෙසේ
අසරණ අපවත් පිරිසිදු කරන්න සමිඳේ

හිරුද තරුද සඳුද මුතු මැණික් ද මුලු ලොවේ
රැගෙන ගියද ඔබට දෙන්න මදිය දෙව්ඳුනේ
දනිති ඔබම මහට දෙන්න හැකි දෙය සමිඳේ
බාර ගන්න මගේ දිළිඳු පඬුර දෙවියනේ